# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2010/31 - 2017 මාර්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2017.03.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2015 සැප්තැම්බර් මස 21 වැනි දිනැති අංක 1933/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලදුව වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2017 මාර්තු මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,<br>ජනාධිපති.

2017 මාර්තු මස 14 වැනි දින,<br>කොළඹ 01,<br>ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

(1) එම නිවේදනයෙහි කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය (අංක 20) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 10 වෙනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

''11. වරලත් ගණකාධිකාරී ආයතනය සමග සම්බන්ධීකරණ කටයුතු<br>12. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනිකුත් සියලුම විෂයයන්<br>13. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම''

(ආ) එහි III වැනි තීරුවෙහි ''රෙදිපිළි පංගු මණ්ඩල පනත (1996 අංක 33)'' යන්නට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

''වරලත් ගණකාධිකාරී ආයතනය පනත (1959 අංක 23)''

03 - 1252


1A - G 25283 — 367 (2017/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*